පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2011/08

මගේ අංකය:-NCP/CS/PT/B/3/1/10
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2011 මාර්තු මස 15 දින.

සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන්,

## ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා සාමාජිකයින් පත් කිරීම

පළාත් සභාවේ වැඩ සැපයුම් සහ සේවා ලබා ගැනීමේදී ඒ සම්බන්ධව අදාළ විධිවිධාන පළාත් මූල්‍ය රීති සංග්‍රහය මගින් පනවා ඇති අතර, වැඩ, සැපයුම් හා සේවා සම්බන්ධව කටයුතු කරනු ලබන ප්‍රසම්පාදන මණ්ඩලවල සංයුතිය සහ සාමාජික සංඛ්‍යාව සහ තාක්ෂණ කමිටු පත්කිරීමට අදාළ විධිවිධාන පළාත් මූ.රී.423 මගින් පනවා ඇත.

02. වැඩ, සැපයුම් සහ සේවා සපයා ගැනීමේදී පළාත් මූල්‍ය රීති මගින් පනවා ඇති විධිවිධාන වලට අමතරව ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය මෙන්ම වෙනත් විදේශාධාර සපයන ආයතන විසින් පනවා ඇති ප්‍රසම්පාදන විධිවිධානද අවස්ථානුකූලව අනුගමනය කළ යුතුවේ. ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය මෙන්ම අනෙකුත් විදේශාධාර සපයන ආයතන විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අරමුණු අතර "විනිවිද භාවය" පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

03. පළාත් සභාවේ ආයතන විසින් ප්‍රසම්පාදන කමිටුවලට සහ තාක්ෂණ කමිටුවලට අදාළ සාමාජිකයින් පත්කිරීමේදී අදාළ කාර්යයට සම්බන්ධ ක්‍රියාවලියේ අවස්ථා කිහිපයකදීම එකම නිලධාරියෙක් යොදවා ඇති අවස්ථා නිරීක්ෂණය වී ඇත. උදාහරණයක් ලෙස වාහන අළුත්වැඩියාවක් සමබන්ධව නිර්දේශ ලබාදුන් ඉංජිනේරුවරයාම තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීම. මෙවැනි පත්කිරීමක් තුලින් අදාළ කාර්යය සම්බන්ධව අපේක්ෂා කරන විනිවිදභාවය යන අරමුණ ඉටු නොවේ. එබැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කිසියම් තීරණයක් හෝ නිර්දේශයක් ලබාදීමට කටයුතු කළ නිලධාරියෙක් එම ක්‍රියාවලියේදී තවත් තීරණයක් හෝ නිර්දේශයක් ලබා ගැනීම සඳහා යොදවා ගැනීම නොකළ යුතුය.

2(..........

04. වාහන අළුත්වැඩියා සම්බන්ධ කටයුතු වලදී අළුත්වැඩියා කටයුතු සඳහා වාහනය ගරාජයට භාරදීමේදී මෙන්ම අළුත්වැඩියාවෙන් පසු ආපසු ලබා ගැනීමේදී වාහනයේ මයිලෝමීටරය ලොග් සටහන් පොත්වල සටහන් නොකරන අවස්ථා නිරික්ෂණය වී ඇත. එබැවින් අළුත්වැඩියාව සඳහා වාහන ගරාජයට භාර දෙන අවස්ථාවේ වන මයිලෝමීටරය මෙන්ව අළුත්වැඩියාවෙන් පසු වාහනය භාර ගැනීමේදී වන මයිලෝ මීටරය ලොග් සටහන් පොතේ අනිවාර්යයෙන්ම සටහන් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

**ඒ.තලාකොටුනගේ,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.